// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1461/11 – 2006 සැප්තැම්බර් 06 වැනි බදාදා – 2006.09.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

#### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ගානා/4/1/1/52.
කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: 13/2000/වීරීපී/238.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගහබඩ පත්තුව උතුර නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 215සී, තල්ගස්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/එන්පීඩී/04/935 හා අ.ග.පි. 526 දරන පිඹුරේ දක්වා ඇති පහත විස්තර වන කැබලි අංක 2614, 2615, 2616 දරන ඉඩම් කොටස්.

**කැබලි අංක 2614**

ඉඩමේ නම: තල්ගස්වල කැලේ; විස්තරය: කැලය, ලඳු කැලය, අවු. 01 ක් පමණ වයසැති කුරුඳු සහ ස්ථිර ගොඩනැගිල්ලක්ද ඇත; හිමිකම් කියන අය: මොරින් සොයිසා මිය, 24ඒ, පළවන පටුමග, කොස්වත්ත පාර, නාවල, රාජගිරිය; ප්‍රමාණය: හෙක්. 15.074.

**කැබලි අංක 2615**

ඉඩමේ නම: තල්ගස්වල; විස්තරය: කුඹුර සහ කැලය; හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.358.

**කැබලි අංක 2616**

ඉඩමේ නම: තල්ගස්වල; විස්තරය: කැලය; හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.057.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2006 ඔක්තෝබර් 27 වැනි දින පූ. භා. 10.00 ට නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2006 ඔක්තෝබර් 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ග. හේ. පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
නාගොඩ.

2006 අගෝස්තු මස 31 වැනි දින,
නාගොඩ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 – 699

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

#### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 06/02/01/123.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ,වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කීරවැලිපත්තුව සුළු කොට්ඨාසයේ, තාඹුගල ග්‍රාම නිලධාරි වසමේ තාඹුගල ගමේ පිහිටි මිනුම්පති විසින් පිළියෙල කරන ලද අංක 3165 දරන පිඹුරේ කැබලි අංක 1 සහ 2 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0139 ක් පමණ වූ පාලම ළඟ කුඹුර නමැති ඉඩම් කැබලි දෙක (02).

හිමිකම් කියන අය: එම්. එල්. සෝමාවතී සහ තවත් අය, තාඹුගල, දංඕවිට.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2006 නොවැම්බර් 15 වැනි දින අ. භා. 2.30 ට වරකාපොළ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2006 නොවැම්බර් 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. ජී. ඒ. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොළ

2006 අගෝස්තු මස 17 වැනි දින,
වරකාපොළ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 – 704

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.